# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,923/4 — 1970 සැප්තැම්බර් 16 වැනි බදාදා – 1970.9.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## ආණ්ඩුවේ නිවේදන

### 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් තැන්පත් පහලයමානැලැ ගෙදර ප්‍රේමදාස උඩගම වන මම, 1962 වර්පයේ ඔක්තෝබර් මස 12 වැනි දින අංක 13,345 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද පිටකොටුව, කො/හාවඩ් බාලිකා විද්‍යාලයට අයත් සියළුම දේපල රජය වෙනුවෙන් භාරගැනීමට, මැද කොළඹ මණ්ඩලයේ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි තැන්පත් රණසිංහ ආරච්චිගේ හෙන්රි රණසිංහ මහතාට මෙයින් බලය පවරමි.

එකී රණසිංහ ආරච්චිගේ හෙන්රි රණසිංහ මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැළැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දක්වීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක්ම එකී පණත යටතේ වරදකරුවෙකු වෙනවා පමණක් නොව එකී පනතේ 27 වැනි වගන්තිය යටතේ දඬුවමට භාජනය කරනු ලැබිය හැකි ද වේ.

පි. උඩගම,
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1970 සැප්තැම්බර් මස 9 දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේදී ය.

9–894/1

---

### 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

මැද කොළඹ මණ්ඩලයේ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි තැන්පත් රණසිංහ ආරච්චිගේ හෙන්රි රණසිංහ වන මම, 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන)-පනතේ 4 වෙනි වගන්තිය යටතේ පැනවුන 1962 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ 12 වැනි දින අංක 13,345 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරාගන්නා ලද පිටකොටුව කො/හාවඩ් බාලිකා විද්‍යාලයට අයත් සියළුම දේපල 1970 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ 15 දින පෙරවරු 10 ට එකී පිටකොටුව කො/හාවඩ් බාලිකා විද්‍යාලයේදී රජය සඳහාද, රජය වෙනුවෙන්ද භාරගැනීමට අදහස් කරන බව එම විද්‍යාලයේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියළු දෙනා වෙතම මෙයින් දැනුම් දෙමි.

2. එම දේපල වලට අයිතිවාසිකම් ඇති සියළු දෙනාම නැතහොත් ඔවුන්ගෙන් බලය ලත් නියෝජිතයින් මෙහි (1) ඡෙදයේ සඳහන් වූ දිනයේදී නියමිත වේලාවට එකී ස්ථානය වෙත පැමිණ එම දේපල රජය සඳහාද, රජය වෙනුවෙන්ද, භාර ගැනීමට මට ඉඩ දෙන ලෙසත්, සහය වන ලෙසත් මෙයින් දැනුම දෙමි.

ආර්. ඒ. එච්. රණසිංහ,
මාණ්ඩලික අධ්‍යාපන නිළධාරි, මැද කොළඹ.

1970 සැප්තැම්බර් මස 4 වෙනිදා,
කොළඹ දීය.

9–894/2


ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

686/11——ජේ 16878—10,825 (70/9)